ශීර්ෂය - 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන්

ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 10 වියදම් ප්‍රකාශය අනුව අංක 290-1-1-0-2103-0-17 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම් වැය විෂය යටතේ රු.2,047,737 ක් මූලධන වත්කම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2024 වර්ෂය තුළ වැය කර තිබුණ ද, දෙපාර්තමේන්තුවේ 2024 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙහි (ACA 6) මිලදී ගැනීම් ලෙස එම වටිනාකම හඳුනාගෙන නොතිබුණු අතර ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.	ප්‍රදානයන් ලෙස මෙම දෙපාර්තමේන්තුවට ලද වත්කම් ගිණුම්ගත කිරීම සඳහා 2024 වර්ෂයේ දී ප්‍රතිපාදන ඉල්ලා ඇතත් නොලැබුණි. එබැවින්**,** 2025 වර්ෂයේදී එම වත්කම් ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපාදන මේ වනවිට ඉල්ලුම් කර ඇත.	මූලධන වත්කම් සඳහා වැය කිරීම්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ආ) අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 70 වාර්තාව අනුව 2024 ජනවාරි 01 දිනට 257/23 අග්‍රිම ගිණුමේ නොපියවූ අග්‍රිම ශේෂය රු.17,042,894 ක් වුවද 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ ඒසීඒ-3 ආකෘතිය 2024 ජනවාරි 01 දිනට එම ශේෂය සඳහා කිසිදු අගයක් දක්වා නොතිබුණි. තව ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 71 වාර්තාව අනුව 257/23 අග්‍රිම ගිණුම සඳහා රු.117,000 ක් 2024 මාර්තු මස භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අතර 2024 ජනවාරි මස රු.17,159,894 ක් භාණ්ඩාගාරය වෙත මුදල් මඟින් පියවීම් කර තිබුණි. ඒ අනුව ඒසීඒ-3 ආකෘතිය පිළියෙල කිරීමේ දී 257/23 අග්‍රිම ගිණුම ඇතුළත් නොකිරීම හේතුවෙන් 2024 මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඒසීඒ-3 ආකෘතිය නිවැරදි නොවීය.	2023.12.31 දිනට දෙපාර්තමේන්තු ආදායම් රැස් කිරීමේ නිල බැංකු ගිණුමට සෘජුවම බැර කර ඇති රු.117,000ක හඳුනා නොගත් ලැබීම් ශේෂයක් පැවති අතර 2024 වර්ෂයේ ජනවාරි මාසයේදී එය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කරන ලදී.නමුත් අතපසුවීමකින් 257/23 අග්‍රිම ගිණුම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒ.සී.ඒ 03 අකෘතියෙහි පෙන්නුම් කිරීමට නොහැකි වී ඇත.	මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඒසීඒ-**3** ආකෘතිය නිවැරදිව පිළියෙල කළ යුතුය.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සවිස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාරයෙන් ලැබීම් රු.840,879,000 ක් හා අග්‍රිම පියවීම් රු.180,389,576 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් රු.841,595,400 ක් හා භාණ්ඩාගාරයට පියවීම් රු.181,105,977 ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂ වල රු.716,400 ක වෙනසක් පැවතුණි.	දිස්ත්‍රික් කාර්යාල විසින් එකතු කරන දෙපාර්තමේන්තු ආදායම සෘජුවම භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය වන අතර 2024.12.31 දින රැස් වූ රු.716,400 ක ආදායම එසේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය වුවද cigas වැඩසටහනෙහි ආදායම් ලැබීමක් ලෙස හඳුනාගත නොහැකි වූ අතර පසුව එය මාරු පත්‍රයක් මඟින් නිවැරදිව හඳුනාගන්නා ලදී. එබැවින්, ඒකාබද්ධ සවිස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි මෙය ඇතුලත් නොවූ නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු.716,400 ද ඇතුලත් නිවැරදි අගයන් නිරූපණය කරන ලදී.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ.
(ii)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 7.7 වගන්තිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය යටතේ පිළියෙල කළ යුතු වුවත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් පදනම මත පිළියෙල කර තිබුණි.	ඉදිරි වර්ෂයන් වලදී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඈ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට ප්‍රේෂණ වටිනාකම් වෙන් වෙන්ව දැක්විය යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ 2024 වර්ෂයේ රු.841,595,400 ක්වූ මුළු භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකමින් රු.181,105,977 ක් වූ භාණ්ඩාගාර ප්‍රේෂණ	2025 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදිව අගයන් හඳුනා ගන්නා ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් හා භාණ්ඩාගාරයට ප්‍රේෂණ වටිනාකම් වෙන් වෙන්ව දැක්විය යුතුය.

වටිනාකම අඩුකර රු.660,489,423 ක් ශුද්ධ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ආදායම් නොවන ලැබීම් යටතේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය ලෙස දක්වා තිබුණි.

(ඉ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	යාත්‍රා නිරීක්ෂණ අංශය මඟින් සිදුකරනු ලබන මෙහෙයුම් කටයුතු සම්බන්ධ පරීක්ෂාවන් සිදුකිරීම සඳහා යාත්‍රා නිරීක්ෂණ දත්ත පද්ධතියේ තොරතුරු දර්ශනය කිරීමට (view only) පරිශීලක නාමයක් රජයේ විගණන අංශය වෙත ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් යාත්‍රා නිරීක්ෂණ අංශයේ ක්‍රියාවලින් පරීක්ෂා කිරීම නොහැකි විය.	විගණන අංශය වෙත නව VMS පරිශීලක ගිණුමක් ලබා දීම සඳහා අමතර ගෙවීමක් සිදු කර අදාල සමාගමෙන් අනුමැතියක් ලබා ගැනීම සිදු කර ගත යුතුය. එමෙන්ම පෞද්ගලික දත්ත ආරක්ෂක පනත අනුව VMS උපකරණ සවි කරන අවස්ථාවේදී එකග නොවූ යම් පාර්ශවයකට VMS දත්ත වැනි සංවේදී දත්ත සැපයීමේදී අදාල යාත්‍රා හිමියාගේ (Data Submit) අවසරය ලබාගත යුතු වේ. එබැවින් දැනට අවශ්‍ය තොරතුරු ඉල්ලා සිටියොත් එම අවස්ථාවේදී එම තොරතුරු ලබා දීමට කටයුතු කල හැකි බව දන්වා සිටිමි.	යාත්‍රා නිරීක්ෂණ දත්ත පද්ධතියේ තොරතුරු දර්ශනය කිරීමට (view only) පරිශීලක නාමයක් රජයේ විගණන අංශය වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් බලපත්‍ර ගාස්තු අයකිරීමේ නියෝග ප්‍රකාරව ප්‍රධාන ක්‍රියාකාරකම් 05 යටතේ බලපත්‍ර ලබාදිය හැකි	2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් බලය ලබා දී ඇති ආකාරයට අවස්ථා 53ක් යටතේ ආදායම් රැස් කිරීම සිදු කරනු ලබයි. එම රැස්වන ආදායමට අදාල බලපත්‍ර නිකුත් කිරීම	බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය.

අවස්ථා 53 ක් සඳහා රාජ්‍ය ආදායම් එකතු කිරීම සඳහා ගාස්තු පැනවීමට අදාල නියෝග අමාත්‍යවරයා විසින් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර නිකුත් කිරීමේ දී පූර්ව අංකනය කිරීමක් සහිත විශේෂිත කඩදාසියක බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රජයට ආදායමක් නොමැතිව බලපත්‍රයක් නිකුත් වීමට අවස්ථාවක් තිබෙන අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එකතුකර තිබූ රු.173,842,450 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම නිකුත් කර තිබූ සියලුම බලපත්‍රවලට අදාල ආදායම බව සැසඳීමට නොහැකිවීම නිසා ඉහත සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.	එක් එක් අංශ මගින් සිදු කරනු ලබන අතර අප දෙපාර්තමේන්තු බැංකු ගිණුමට රැස්වන මුදල් මාර්ගගත ක්‍රමය හරහා රැස්කර ගෙන ඇති ආදායම පහසුවෙන් සංසන්දනය කර ගත හැක.	

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ 290-1-1-14-1504-0/11 වැය විෂයය සඳහා රු.800,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර ඉන් සියයට 88ක් එනම් රු.708,729,543 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.	2024 ඔක්තෝබර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2024 වර්ෂයේ ඔක්තෝබර් මස සිට මාස 06ක කාලයක් සඳහා ක්‍රියාත්මක කරන ලද ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන සඳහා ඔක්තෝබර් සිට දෙසැම්බර් මාසය දක්වා ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන ලද අයදුම්පත් සඳහා රු.මිලියන 800 ක පරිපූරක ප්‍රතිපාදන ලබා ගන්නා ලදී. නමුත් ධීවර ප්‍රජාවට මෙම ගෙවීම් ක්‍රියාවලියට අනුගතවීමට යම් කාලයක් ගතවූ බැවින් වවුචර් ඉදිරිපත් වීමේ යම් ප්‍රමාදයක් ඇතිවිය. එබැවින්, 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් වූ අයදුම්පත් සඳහා පමණක් ගෙවීම් කරන ලද බැවින් ප්‍රතිපාදන ඉතිරි විය.	නිවැරදිවූත් තාත්විකවූත් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.
(ආ)	2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් පුනරාවර්තන වැය විෂයයන් 3 ක් හා මූලධන වැය විෂයයන් 2 ක් සඳහා සලසාගෙන තිබුණු රු.844,500,000	පුනරාවර්තන වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිවීමට එළදායී ජීව කාලය ඉක්මවා ඇති යන්ත්‍රවල අලුත්වැඩියා ගිවිසුම් අලුත් කිරීම සීමා	නිවැරදිවූත් තාත්විකවූත් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

ක්වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් රු.752,587,016 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 84 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.	කිරීම හේතු වී තිබූ අතර ප්‍රාග්ධන වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිවීමට 2103 යටතේ රේඩියෝ යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබීමත් 2106 යටතේ මිලට ගැනීමට සැලසුම් කරන ලද Cloud Server පද්ධතිය සඳහා මාසිකව ගෙවීම් කිරීම පුනරාවර්තන වියදම් ලෙස හඳුනා ගන්නා ලදී.	

3.3 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.36,085,002 ක තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	6000 – 0 – 0 – 16 – 0 – 47 දරන කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු ගිණුමේ රු.2,141,459 ක මුදල අලුතින් ඉදි කරන ලද යාත්‍රා නිරීක්ෂණ පද්ධති ගොඩනැගිල්ලට අදාළ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් වන අතර එම මුදල් ගොඩනැගිල්ලේ අඩුපාඩු සකස් කිරීම සඳහා රඳවාගන්නා ලදී. 6000–0–0–2–0– 96 දරන ටෙන්ඩර් තැන්පතු ගිණුමේ ශේෂය මේ වන විට නිරවුල් කර ඇත.	වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	අංක 6000-0-0-13-0-64 දරන පොදු තැන්පතු ගිණුමේ වසර 02 ට වැඩි ශේෂය පෞද්ගලික ආයතනයට යාත්‍රා නිරීක්ෂණ පද්ධති ගාස්තු ගෙවීම සඳහා 2022 වර්ෂයේ දී යාත්‍රා හිමියන්ගෙන් ලැබුණු මුදල්වලින් ඉතිරිව පවතින මුදල් වන අතර එම මුදල් නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු නොකර එම තැන්පතු ශේෂය වර්තමානයේ යාත්‍රා නිරීක්ෂණ පද්ධති සේවා සපයන වෙනත් පෞද්ගලික සමාගමක් වෙත යාත්‍රා නිරීක්ෂණ පද්ධති ගාස්තු ගෙවීම සඳහා යොදාගෙන තිබුණි.	මෙම ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථාවේ දී මෙම යාත්‍රා නිරීක්ෂණ පද්ධති ගාස්තු ගෙවීම සඳහා යාත්‍රා හිමියන්ගෙන් රැස්කර ගන්නා මුදල් සංචිතයක් ලෙස පවත්වා ගන්නා ලෙස භාණ්ඩාගාර ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව උපදෙස් දෙන ලදී. එබැවින් පැරණි යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය පැවති සමයේ යාත්‍රා හිමියන්ගෙන් රැස්කර ගන්නා ලද මුදල් රජයේ ආදායමට බැර නොකර ඉදිරි ගෙවීම් සඳහා රඳවා ගන්නා ලදී.	වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් රු.මිලියන 25 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් සඳහා සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂා කලද, ඊට අදාළව කිසිදු භෞතික කාර්යසාධනයක් ලබා කරගෙන නොතිබුණි.	ජපානයේ පුද්ගලික සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇතත් එම සමාගමේ දේශීය නියෝජිත සමාගම සමඟ දෙපාර්තමේන්තුව මීට පෙර මිලදීගත් රේඩියෝ යන්ත්‍ර සම්බන්ධයෙන් බේරුම්කරණයට ගොස් ඇති බැවින් එම නියෝජිත සමඟ මෙම මිලදීගැනීම සම්බන්ධයෙන් නීතිමය එකගතාවය ලබාගැනීම සඳහා මෙම ගැටලුව නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බැවින් මෙම මිලදී ගැනීම සිදු නොකරන ලදී.	ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලැසුම් කළ පරිදි යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම්වල භෞතික කාර්යසාධනය ප්‍රමාණවත් පරිදි ලබා කරගත යුතුය.

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 මාර්තු 12 දිනැති අංක DFAR/INV/AUDIT/2024-VOIII දරන ලිපිය මගින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2024 වර්ෂය තුළ සිදුකරන ලද විමර්ශන සංඛ්‍යාව 217 ක් වුවද කාර්යසාධන වාර්තාවේ 2.1 පරිච්ඡේදයේ 11 විමර්ශන කටයුතුවල ප්‍රගතිය යටතේ VMS මගින් නීති කඩ කිරීම් සඳහා වන විමර්ශන 800 ක ඉලක්කයක් 2024 වර්ෂයේ සපුරාගෙන ඇති බව දක්වා තිබුණි.	මූලික කරුණු පරික්ෂාවෙන් පසුව නැවත ගමන්වාර ලබා දීම් සිදුකරන අවස්ථාවන්ද ඇතුලත්ව සිදුකරන ලද සමස්ථ විමර්ශන සංඛ්‍යාව කාර්යය සාධන වාර්ථාවේ ප්‍රගතිය ලෙස ඇතුළත් කර ඇත.	කාර්යසාධන වාර්තාවට නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුය.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයන් සාමූහිකවත් තනි තනිවත් ගනු ලබන තීරණ කෙරෙහි වගකිව යුතු බව සඳහන් වුවද 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගුවන් විදුලි සන්නිවේදන උපකරණ 07 ක් අදාළ පිරිවිතරයන්ට	ගුවන් විදුලි සම්ප්‍රේෂණ යන්ත්‍රවල භාවිතයේදී ඇති වූ තාක්ෂණික ගැටලු මත මෙම තත්ත්වය ඇතිවූ අතර ගුවන්විදුලි සම්ප්‍රේෂණ යන්ත්‍රයක නිසි ක්‍රියාකාරීත්වය තහවුරු කර	ධීවර කටයුතු නියාමනයට ගුවන් විදුලි සන්නිවේදන උපකරණ අත්‍යාවශ්‍ය බැවින් ඒවා පූර්ණ ක්‍රියාත්මක තත්ත්වයේ

	අනුව ඇනවුම් කර තිබිය දී එම පිරිවිතරයන්ට අනුකූල නොවන ගුවන් විදුලි උපකරණ සපයා තිබීමත් හා ඒ සඳහා රු.7,084,000 ක් ගෙවීම් කිරීමට තාක්ෂණ ඇගයීම් කමිටුව නිර්දේශ කිරීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම් හා රජයට පාඩු සිදුවීමක් සිදුවී තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් විගණිත දිනවන විට එම තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ට එරෙහි කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද 2020 පෙබරවාරි 24 හා 2020 මැයි 26 දිනයන්හිදී එම මුදල් නැවත දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කරන ලෙසත් නැතහොත් නෛතික පියවර ගන්නා බව ආයතනය වෙත දන්වා තිබුණ ද වසර 05 ක් ගත වී තිබුණ ද මෙම ගැටලුව නිරාකරණය කරගෙන නොතිබුණි.	ගැනීමට අවම සති දෙකක කාලයක් වත් ක්‍රියාත්මක කර බැලිය යුතුය. එසේ හෙයින් මෙම යන්ත්‍රවල ගැටලු ඇති වීම, ඒවා සවිකර හඳුනා ගනු ලැබිය .මේ වන තෙක් බේරුම්කරණයේ අවසන් තීරණයක් ලැබී නොමැත.	පවත්වා ගත යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුව වෙත 250W ධාරිතාවෙන් යුත් ගුවන් විදුලි සන්නිවේදන උපකරණ 05 ක් නැවත මිලදී ගැනීම සඳහා 2024 පෙබරවාරි මස ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණද 2025 මැයි 20 දින වන විටත් එම ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ලංසු තැබීමේ ක්‍රියාවලිය යටතේ 250W ධාරිතාවයෙන් යුත් ගුවන් විදුලි සන්නිවේදන උපකරණ 05 ක් සඳහා ජපන් සමාගමක් තෝරාගෙන තිබුණද එහි දේශීය නියෝජිත ඉහත 2019 වර්ෂයේ ගුවන් විදුලි උපකරණ මිලදී ගත් ආයතනය වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර නොතිබුණි. එමෙන්ම ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගැනීම සඳහා යොමු වී තිබුණද ධීවර යාත්‍රා සහ ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ සන්නිවේදන පහසුකම් ලබාදීම යන ප්‍රධාන කාර්යය විගණිත දිනවන විටත් නිරාකරණය වී නොතිබුණි.	2024 වර්ෂයේදී මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවීමේදී ඉදිරිපත් වූ සමාගම් හතර අතරින් ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩරය පිරිනමන ලද ජපාන සමාගමෙහි ශ්‍රී ලංකාවේ නියෝජිත පෞද්ගලික සමාගම විසින් ධීවර දෙපාර්තමේන්තුව සමඟ තිබෙන පෙර ගිවිසුම සම්පූර්ණ නොකිරීමේ ගැටලුව මත එය මේ වන තෙක් ක්‍රියාත්මක වී නොමැත.	ධීවර කටයුතු නියාමනයට ගුවන් විදුලි සන්නිවේදන උපකරණ අත්‍යාවශ්‍ය බැවින් ඒවා පූර්ණ ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගත යුතුය.

4.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් රු.16,519,961 ක් වූ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 06 වන මහලේ ජලය කාන්දුවීමත් නිසා සිදුවූ හානිය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණු අතර	6 වන මහලේ වැසි ජලය කාන්දු වීමෙන් සිදු වූ අලාභය පිළිබඳව මු.රෙ 104 යටතේ සිදු කරන ලද පරීක්ෂණය හි කමිටු වාර්තාව 2023.06.30 දින ඉදිරිපත් කර ඇති අතර,	හානි හා පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

	අලාභයට වගකිව යුතු පාර්ශව පැහැදිලිව හඳුනාගෙන රජයට සිදු වී තිබුණු අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඒ අනුව සකස් කරන ලද සමාලෝචන කමිටු වාර්තාව 2023.10.10 දින ධීවර අමාත්‍යාංශය වෙත යවන ලදී. අමාත්‍යාංශ කමිටුව හරහා සිදු වූ අලාභය සම්බන්ධයෙන් ලබාදෙන නිර්දේශ අනුව හානි පාඩු ලේඛනයෙන් කපාහැරීම සිදු කිරීමට කටයුතු කළ හැකිය.	
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අලාභ හානි වටිනාකම රු.250,000 ඉක්මවූ අලාභයන් ගණන්දීමේ නිලධාරී විසින් හානි පාඩු ලේඛනයෙන් කපාහැරීම සඳහා අනුමත කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ තංගල්ල දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ කාර්යාල ගොඩනැගිල්ල 2023 අගෝස්තු 22 දින ගිනි ගැනීමකට ලක් වී තිබීම හේතුවෙන් සිදු වූ රු.2,043,000 ක අලාභයෙන් රු.306,450 ක් අයකර ගැනීමෙන් පසු ඉතිරි රු.1,736,550 ක මුදල දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරිගේ නිර්දේශය මත පොත් වලින් කපාහැර තිබුණි.	මෙම අලාභය කපා හැරීමට අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස අදාල විෂය භාර නිලධාරිනියට උපදෙස් ලබා දී ඇති අතර චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතියට යොමු කල යුතු සීමාවන් සම්බන්ධයෙන් නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	කොළඹ දිස්ත්‍රික් ධීවර කාර්යාලයට අනුයුක්තව කටයුතු කරනු ලබන සංවර්ධන නිලධාරිනියක් වෙත 2022 මැයි 18 දින ලබා දී තිබුණු ටැබ් යන්ත්‍රය 2024 සැප්තැම්බර් 03 දින සොරාගෙන තිබීම පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් පවත්වා නොතිබුණු අතර එම පාඩුව පාඩු හා හානි ලේඛනයේ ඇතුළත් කර තිබුණ ද 2024 මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.	අතපසු වීමකින් මු.රෙ. 104 පරීක්ෂණයක් පැවැත්වීමට නොහැකි වූ බැවින් 2025.03.18 දින ඒ සඳහා කමිටුවක් පත් කරන ලදී. පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් අනතුරුව ලැබෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.	හානි පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ගුවන් විදුලි සන්නිවේදන උපකරණ මිලදී ගැනීම			
(i)	දෙපාර්තමේන්තුවේ ධීවර මෙහෙයුම් අංශය විසින් පවත්වාගෙන යනු ලබන සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 19 විසින් භාවිතා කරනු ලබන ගුවන් විදුලි යන්ත්‍ර ඉතා පැරණි යන්ත්‍ර වන අතර ඉන් කොළඹ, මිරිස්ස, නිල්වැල්ල, කිරින්ද යන සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 04 හි ගුවන් විදුලි	මේ වන විට දෙපාර්තමේන්තුව භාවිතා කරනු ලබන්නේ වසර 10 කට වඩා පැරණි ගුවන් විදුලි යන්ත්‍ර වන අතර ඒවා පූර්ණ කාර්යක්ෂමතාවයෙන් ක්‍රියාත්මක නොවේ. නව ගුවන් විදුලි යන්ත්‍ර පහක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන	ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කර ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන

	යන්ත්‍ර 2024 දෙසැම්බර් 31 දිනවන විට අක්‍රීයව පැවතුනි. තවත් සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 06 ක භාවිතා කරන ගුවන් විදුලි යන්ත්‍ර වසර 20 කට වඩා පැරණි යන්ත්‍ර වන අතර එම යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය සියයට 50 ක මට්ටමේ පැවතුණි. මෙම පැරණි ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය කර තිබූ ආයතන විසින් එම මොඩලයේ ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය නවත්වා ඇති බැවින් එම යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට ද අපහසු වී තිබුණි.	කටයුතු සිදුකළද ඇතිවූ තාක්ෂණික ගැටලු හේතුවෙන් මේ වනතෙක් එම ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.	පහසුකම් කඩිනමින් ස්ථාපිත කළ යුතුය.
(ii)	දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ රු.12,397,000 ක් වටිනා ගුවන් විදුලි සන්නිවේදන උපකරණ 07 ක් මිලදීගෙන තිබුණු අතර ඉන් එක් ගුවන් විදුලි යන්ත්‍රයක් පමණක් 100W ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන නමුත් එහි බලවර්ධක කොටස ක්‍රියාත්මක නොවන බව 2025 පෙබරවාරි 24 දිනැති අංක DFAR/F/1/4/1- වෙළුම දරන ලිපිය මගින් විගණනය වෙත දන්වා තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ මිලදී ගන්නා ලද 400W අධි බලැති ගුවන් විදුලි යන්ත්‍ර 07, 2024 දෙසැම්බර් 31 දිනවන විටත් පූර්ණ ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.	මෙම ගුවන්විදුලි යන්ත්‍ර සපයන ලද ආයතනය ටෙන්ඩර් පිරිවිතරයන්ට අනුකූල නොවන පරිදි භාණ්ඩ සපයා තිබීමත් ඒවා ස්ථාපිත කර ක්‍රියාත්මක තත්ත්වය පෙන්නුම් කිරීමට අපොහොසත් වීමත් හේතුවෙන් මෙම ගුවන් විදුලි යන්ත්‍ර පිළිබඳ ගැටලුව බේරුම්කරණයට යොමු කර ඇත.බේරුම්කරණ ක්‍රියාවලියේ අවසාන විසඳුමකට මේ වන තෙක් පැමිණීමට නොහැකිවීම හේතුවෙන් මෙම ගුවන් විදුලි යන්ත්‍ර සම්පූර්ණයෙන්ම සවිකර නොමැත. නමුත් මේ වනවිට එම ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	ධීවර කටයුතු නියාමනයට ගුවන් විදුලි සන්නිවේදන උපකරණ අත්‍යාවශ්‍ය බැවින් ඒවා පූර්ණ ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගත යුතුය.

(ආ) බහු දින ධීවර යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) උපකරණ සවි කිරීම

(i)	2021 වර්ෂයේ ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ලබාදුන් යාත්‍රා නිරීක්ෂණ පද්ධති උපකරණ 4200 කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව බහුදින ධීවර යාත්‍රාවල නොමිලේ සවිකළ යුතු බවට දෙපාර්තමේන්තුව තීරණය කර තිබූ අතර 2024 ඔක්තෝබර් 31 දින වනවිට එලෙස යාත්‍රා නිරීක්ෂණ පද්ධති උපකරණ සවිකර තිබුණු බහුදින ධීවර යාත්‍රා ගණන 4084 ක් විය.තවත් උපකරණ 25 ක් හදිසි භාවිතයන් සඳහා යොදා ගැනීමට තබාගෙන තිබුණු අතර 2024 ඔක්තෝබර් 31 දිනවන විට උපකරණ 91ක් යාත්‍රා වලට සවි නොකර ඉතිරිව තිබුණි. 2021 වර්ෂයේ ලද මෙම උපකරණ 2024 වර්ෂය අවසාන වනවිටත් සවිකිරීම් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් විදේශීය ප්‍රදාන වලින් ලැබෙන සහනාධාර ධීවර ප්‍රජාවට නිසි පරිදි ලබා දීමට නොහැකි වී තිබුණි.	2021 වර්ෂයට පෙර තීරණය කරන ලද සියලු බහුදින යාත්‍රා සඳහා නොමිලේ යාත්‍රා නිරීක්ෂණ පද්ධති උපකරණ සවිකිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව ලෙස ආරම්භයේදී වසර තුනක් (03) ලෙස තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ද මේ සඳහා විශාල කාලයක් ගතවන බව නිරීක්ෂණය විය. දිවයිනේ සියලු ධීවර වරායන් වලින් යාත්‍රා ක්‍රියාත්මක වීම, ධීවර කටයුතුවල යෙදෙන අතරතුරම යාත්‍රාවලට උපකරණ සවිකිරීමට සිදු වීම, ධීවරයින් දැනුවත් කිරීමට සිදුවීම, මීට පෙර පළමුවරට යාත්‍රා නිරීක්ෂණ පද්ධති සවි කිරීමේ දී ධීවරයින්ගෙන් විශාල විරෝධතාවයක් ඇතිව තිබීම වැනි තත්වයන් මෙම ව්‍යාපෘතියේ කාලය තීරණය කිරීමේදී සැලකීමට සිදු	විදේශ ප්‍රදාන තුළින් ලැබෙන සහනාධාර ධීවර ප්‍රජාවට නිසි පරිදි ලබා දිය යුතුය.

		විය.එමෙන්ම මෙම උපකරණ අදාල රටෙහි නිෂ්පාදනය කර ආනයනය කලයුතු වූ අතර එබැවින් එක්වරම සියල්ල නොලැබුණු අතර කාණ්ඩ වශයෙන් මෙරටට ලබා දීම සිදුවිය.	

(ඇ) සියයට 50 ක සහනාධාර ක්‍රමය යටතේ බහුදින ධීවර යාත්‍රා ඉදිකිරීම

(i)	සියයට 50 ක සහනාධාර ක්‍රමය යටතේ නවීන තාක්ෂණයෙන් යුත් රු.මිලියන 26 ක් වටිනා අඩි 55 බහුදින ධීවර යාත්‍රා 10 ක් ඉදිකිරීමටත් එම බහුදින ධීවර යාත්‍රා 10 හි මුළු පිරිවැයෙන් සියයට 50 ක් හෙවත් රු.මිලියන 130 ක්ද වැට් බද්දෙන් සියයට 50 ක් හෙවත් රු.මිලියන 19.5 ක්ද රජය මඟින් දැරීම සඳහාත් 2016 ජුනි 28 දිනැති අමප අංක 16/1233/725/020-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව යාත්‍රා 5 ක් සීනෝර් පදනම මඟින් සෘජුවම ඉදිකරවා ගැනීමටත්, අනෙක් යාත්‍රා 05 සී-නෝර් පදනමේ අධීක්ෂණය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික අංශයේ බෝට්ටු ඉදිකිරීමේ ආයතනයක් මඟින් ඉදිකිරීමටත් කටයුතු කර තිබුණි. 2025 මැයි 20 දින වනවිට එම යාත්‍රා 10 න් 8 ක් ප්‍රතිලාභීන් වෙත භාර දී තිබූ අතර පුද්ගලික සමාගම මඟින් ඉදිකරවා ගැනීම සඳහා ගිවිසුම්වලට එළඹී තිබූ යාත්‍රා 02 ක් විගණිත දිනවන විට වසර 08 ක් ගත වී පැවතුණද නිෂ්පාදන කටයුතු අවසන් කර ප්‍රතිලාභීන්ට භාරදීමට කටයුතු කර නොතිබුණි. 2024 ජුනි 24 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ ධීජදෙ/ධීසං/අඩි55/2023, සමාංක දරන ලිපි අනුව දිනකට රු.247,000 ක් බැගින් ප්‍රමාද ගාස්තු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බවත් දක්වා තිබුණ ද යාත්‍රාව නිමකර භාර දීමට හෝ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම බහුදින ධීවර යාත්‍රා 2 සඳහා රජය විසින් සපයන සියයට 50 දායකය ලෙස රු.29,900,000ක් යාත්‍රා නිෂ්පාදන පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු අතර මීට අමතරව මෙම යාත්‍රා සඳහා ප්‍රතිලාභියාගේ දායකත්වයෙන් අයවිය යුතු වැට් මුදල, 2025 මැයි 20 දින වන විට එකතුව රු.11,900,000 ක් විය. නිෂ්පාදනය සම්පූර්ණ කල යාත්‍රා 07ක් (01 යාත්‍රාවක් ගිනිගෙන විනාශ වී ඇත) අදාළ හිමිකරුවන් වෙත භාර දී වසර 5 ක් ගත වුවද එම යාත්‍රා තවදුරටත් අයිතිකරුවන් වෙත විධිමත් පරිදි පවරා දී නොතිබූ අතර සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලී තිබුණේ යාත්‍රා 05ක් පමණි.	ඉතිරි යාත්‍රා දෙකෙහි නිෂ්පාදන කටයුතු අවසන් කිරීම සඳහා අමාත්‍යාංශයේ ද මැදිහත් වීම යටතේ කටයුතු කරමින් පවතී. මේ සම්බන්ධයෙන් 2024.09.27 දින ධීවර අමාත්‍යාංශ, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු, සීනෝර් පදනමේ හා පුද්ගලික සමාගමේ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අතර යාත්‍රා නිෂ්පාදන කටයුතු අවසන් කිරීමට සහන කාලයක් ලබාදීමට එකඟතාව ඇති විය. යාත්‍රා වල නිෂ්පාදන කටයුතු අවසන් කරගැනීමට කටයුතු සිදුකර ඇති බැවින් දඩ මුදල් අයකර ගැනීම හෝ යාත්‍රා නැවත භාර ගැනීම සිදු වී නොමැත. සීනොර් පදනම හරහා අදාල යාත්‍රාංගනය වෙත මුදල් ගෙවන ලදි. සියයට 50 දායකත්ව මුදලට අදාල වැට් අගය රහිතව ගෙවා ඇති බැවින් එම ප්‍රතිලාභියාට වැට් මුදල වහාම ගෙවීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. යාත්‍රා 2 ක් මියන්මාර් සහ සීසෙල්ෂ් රාජ්‍යයන් විසින් අත්අඩංගුවට ගෙන තිබූ අතර IMULA1028TLE යාත්‍රාව දියෝගෝ ආෂියා රාජ්‍යයේ මුහුදු සීමාට ඇතුළත් වීම හේතුවෙන් අත්අඩංගුවට පත්ව නඩු පවරා ඇත. ඉතිරි යාත්‍රා සක්‍රීය ධීවර කර්මාන්තයේ ක්‍රියාත්මක වේ.	රජයේ අරමුණු ඉටුවන ලෙස යාත්‍රා ඉදිකිරීම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය, ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකරගැනීමට සහ ප්‍රමාදයන් සම්බන්ධයෙන් නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. තවද ප්‍රතිලාභීන්ගෙන් ලැබිය යුතු දායකත්ව මුදල් කාල ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට හා ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය

(i)	කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ධීවර දිස්ත්‍රික්ක 07ක කලපු 9ක් සඳහා කණු 18,071ක් ඇණවුම් කර තිබුණි. ඉන් රු.21,176,486ක් වූ කණු 14,636 ක් සපයා තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනවන විට ඉන් රු.11,515,615ක් වටිනා කණු 7948ක් කලපු සීමා ලකුණු කිරීම සඳහා සිටුවා නොතිබුණි. හලාවත කලපුව සඳහා කණු 1,784 ක් අවශ්‍ය බව හඳුනාගෙන තිබුණ ද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කණු 4060 වශයෙන් සාවද්‍ය ලෙස සටහන් කිරීම නිසා ඉතිරි වූ කණු 2,164 ක්, රු.1,895,448 ක් වැය කර පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කර තිබුණි. මුන්දලම කලපුව සඳහා නිෂ්පාදිත කණු 3030 විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමකින් තොරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කර ඒ වෙනුවෙන් 1,435,000 ක් ගෙවා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට එයින් කණු 1595 සිටුවීමට තිබුණි.	හලාවත කලපුව සඳහා මායිම් කණු 1784ක් වෙනුවට 4060 ක් ලෙස ලිපිය මුද්‍රණයේ දී සටහන් වීම නිසා වැඩි කණු 2164ක් රු.1,895,448ක් වැයකර පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කර ඇත. මුන්දලම කලපුවේ ඉතිරි කණු 1595 ක් සිටුවීමට වයඹ පළාත් පාලන කොමසාරිස් විසින්, පළාත් පාලන සේවකයින් යෙදවීමට හැකියාව පවතින බව දැන්වූවද, ඇස්තමේන්තු ඉදිරිපත් කර නොමැති හෙයින් ලියාපදිංචි ධීවර සංවිධාන සමිති මඟින් මෙම කාර්යය කරගැනීමට ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී.	ඉතිරිව ඇති කණු කාල ප්‍රමාදයකින් තොරව කලපු සීමා ලකුණු කිරීම් සඳහා යොදා ගත යුතුය. මුදල් රෙගුලාසි 128(1) (එ) ප්‍රකාරව රජයේ කටයුතු කිරීමේ දී අපේක්ෂිත අරපිරිමැස්ම කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංක බව යන කරුණු පිළිබඳව නිසි සැලකිල්ලෙන් යුක්තව කටයුතු කල යුතු අතර අමතරව දැරීමට සිදු වූ මහජන මුදල් වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය.

(ඉ) අන්තර්ජාතික ධීවර කළමනාකරණ කටයුතුවලට අදාළ නිලධාරීන් සඳහා අවදානම් දීමනාවක් ලබාදීම

(i)	දෙපාර්තමේන්තුවේ අන්තර්ජාතික ධීවර කළමනාකරණ කටයුතුවලට අදාළ නිලධාරීන් සඳහා අවදානම් දීමනාවක් ලබාදීම හා එම නිලධාරීන් වෙනුවෙන් ජීවිත රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම සඳහා 2016 ජූලි මස 21 දිනැති අංක අමප/16/0333/725/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ අන්තර්ජාතික ධීවර කටයුතුවල යෙදෙන වරාය කාර්යාල 12 ක් හා ප්‍රධාන කාර්යාලයේ අදාළ රාජකාරි කටයුතු කරන අංශ සඳහා නිලධාරීන් 147 ක් වෙනුවෙන් එක් නිලධාරියෙක් සඳහා රු.5,000 බැගින් මාසික දීමනාවක් ලබාදීමට හා රු.මිලියන 2.5 ක රක්ෂණාවරණයක් ලබාදීමට අනුමැතිය ලබා දී තිබුණි. මෙම දීමනාව ලබාගැනීම සඳහා අවම වශයෙන් සතියකට රාත්‍රී වැඩමුර දෙකක් හෝ සති අන්ත වරු දෙකක් හෝ රාත්‍රී වැඩ මුරයක් සමඟ සති අන්ත වරුවක් වශයෙන් අදාළ නිලධාරීන් රාජකාරියේ යෙදිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවද විමර්ශන අංශය හා අන්තර්ජාතික ධීවර අංශයේ රාජකාරියේ යෙදී	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකයේ රාත්‍රී වැඩමුර සිදු කරනු ලබන නිලධාරියකු විසින් සතියකට පැය 24 රාත්‍රී වැඩ මුර දෙකක් පමණ සිදුකරනු ලබයි. 2024 වසර තුළදී රාත්‍රී වැඩ මුර නිලධාරීන් පස් දෙනෙකු පමණ සෑම සතියකදීම රාත්‍රී වැඩ මුර රාජකාරි දෙක බැගින් සිදුකර රුපියල් පන්දහසේ දීමනාවට සුදුසුකම් ලබා ඇත. එම ඒකකයේ සහ විමර්ශන අංශයේ නිලධාරීන් 6 දෙනෙකු රාත්‍රී වැඩමුර සිදු නොකර සතිඅන්ත රාජකාරි හා ඉතා අත්‍යවශ්‍ය ජාත්‍යන්තර ධීවර කටයුතු රාජකාරි රාත්‍රියේ දී හෝ දවසේ ඕනෑම වේලාවක නිවසේ සිට ඉටුකිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත්ව ගෙවීම් නිර්දේශ කර ඇත. තවද මෙම දීමනාවට අදාළ වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ වාර්තාව මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත වූ පසු	අමාත්‍ය මණ්ඩල තීරණය හා අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	නිලධාරීන් 11 දෙනෙකු විසින් සතියකට නොව මසකට රාජකාරි ඉටු කළ රාත්‍රී වැඩමුර දෙකක් හෝ සති අන්ත වරු දෙකක් හෝ රාත්‍රී වැඩමුරයක් සමඟ සතිඅන්ත වරුවක් වශයෙන් රාජකාරි ඉටුකිරීම සඳහා 2024 වර්ෂයේදී රු.510,000 ක දීමනාවක් ගෙවා තිබුණි. එසේම අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමත කළ රක්ෂණාවරණයක් 2025 මැයි 20 දින වන විටත් ලබාගෙන නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත එවන ලද ලිපි ගොනුවල අමුණා නොතිබිණි.	
(ii)	2016 ජුනි 22 දිනැති අංක Circular/DFAR/HSFU/2016/06 දරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව එම නිලධාරීන් විසින් ඉදිරි වැඩසටහන් හා රාජකාරී දින පොත් පවත්වා නොතිබුණි.	2024 වර්ෂය සඳහා රාජකාරි දිනපොත් විමර්ශන අංශයේ නිලධාරීන් වෙත ලබා දී නොමැති බවත් ඒ අනුව එම වර්ෂයේ ජනවාරි සිට ජුලි මස දක්වා එක් එක් මාසයට අදාල ක්ෂේත්‍රගත රාජකාරී වල නියැලීමට අදාල ලේඛනවල පිටපත් ඇත.	අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iii)	කාර්යසාධනය ඇගයීම සඳහා අනිවාර්ය අවශ්‍යතා සපුරා ඇත් ද යන්න පරික්ෂා කර නොතිබුණු අතර විමර්ශන අංශයේ නිලධාරීන් විසින් 2024 වර්ෂයේ මෙම දීමනාව ලබා ගැනීමේදී ඇතැම් මාසවල අතිරේක රාජකාරී ඉටුකර නොතිබියදීත් දීමනා ගෙවීම් සිදු කර තිබුණි.	2024 වර්ෂයේදී මෙම දීමනාව ලබා දීමේදී අදාල කාලසීමාව තුල බලය පවරන ලද මාණ්ඩලික නිලධාරි විසින් මෙම නිලධාරින් වෙත පවරා තිබූ රාජකාරි සහ එම රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීම සබන්ධව සෑහීමකට පත් වීම මත මෙම දීමනාව ලබා දීම අනුමත කර ඇත.	ප්‍රගති වාර්තා පදනම් කරගෙන ඇගයීම් කටයුතු සිදුකළ යුතු අතර අතිරේක රාජකාරි ඉටුකර තිබීම මත දීමනා ගෙවිය යුතුය.

(ඊ) මත්ස්‍ය ඒකරාශීකරණ ඇටවුම් (FAD) ස්ථාපනය

(i)	කොග්ගල මසුන් ඒකරාශි ඇටවුම රු.මිලියන 7.1 කට 2024 සැප්තැම්බර් 27 දින සිට වසරක කාලයකට ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ අනපේක්ෂිතව සිදුවන හානි සහ අයහපත් කාලගුණය නිසා ඇති වන හානි (accidental damages and damage due to adverse weather) ආවරණය කර වාරිකය රු.302,406 ක් බැගින් වන සේ රක්ෂණය කර තිබුණි. කොග්ගල ප්‍රදේශයේ 2024 නොවැම්බර් 06 දින ස්ථාපිත කළ ඇටවුම (FAD) 2025 ජනවාරි 14 දින අස්ථානගත වී තිබූ අතර රක්ෂණ සමාගමෙන් රක්ෂණ හිමිකම් ඉල්ලුම් කර විගණිත දිනය වූ 2025 අගෝස්තු 27 දින වන විටත් මාස 07 ක් ගත වී තිබුණ ද රක්ෂණ සමාගමෙන් ඒ සඳහා කිසිදු පිළිතුරක් ලැබී නොතිබුණි. රක්ෂණ සමාගමෙන් ප්‍රතිචාරයක් ලබාගැනීමට හා ඇටවුම සඳහා වන්දි මුදලක් ලබාගැනීමට දෙපාර්තමේන්තු කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණු අතර 2025 අගෝස්තු 27 දින වන විට ඒ සඳහා දරා තිබූ පිරිවැය වූ රු.7,914,548 කින් රජයට පාඩුවක් හා ඒ තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ධීවර ප්‍රජාව හට ලබා දීමට අපොහොසත් වී තිබුණි.	රක්ෂණ හිමිකම ලබා නොදීම පිලිබඳ පැමිණිල්ලක් 2025.08.13 දින රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.	රු.මිලියන 7.1 ක්වූ අලාභය රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ii)	ශ්‍රී ලංකාව තුළ දෙවන මත්ස්‍ය ඒකරාශීකරණ ඇටවුම (FAD) මීගමුව ප්‍රදේශයේ 2025 ජූලි 11 දින ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා වැය කළ මුළු මුදල රු.5,853,486 ක් වූ අතර එය රක්ෂණය කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2025 මැයි 19 දිනැතිව රක්ෂණ සමාගම වෙත යොමුකළ "කොග්ගල මත්ස්‍ය ඒකරාශීකරණ ඇටවුම (FAD) අස්ථානගත වීම සම්බන්ධ සිද්ධි වාර්තාව" ට අනුව ඉදිරියේ දී ස්ථාපනය කරන මෙම ඇටවුම්වල ආරක්ෂාව පිළිබඳව ඒ ඒ ප්‍රදේශවල ධීවර සංවිධාන සමඟ ගිවිසුම් අත්සන් කිරීම නිර්දේශ කර තිබුණ ද මීගමුවේ ස්ථාපනය කළ ඇටවුම සඳහා ධීවර සංවිධාන සමඟ විගණිත දින වූ 2025 අගෝස්තු 27 දින වන විටත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	මීගමුවේ මත්ස්‍ය ඒකරාශී කරන ඇටවුම රක්ෂණය කිරීම සඳහා මිල ගණන් කැඳවුවද කිසිදු රක්ෂණ සමාගමක් මේ සඳහා ඉදිරිපත් නොවිණි. 2025.07.01 දින පැවති අමාත්‍යාංශයේ ආයතන ප්‍රධානීන්ගේ රැස්වීමට දැන්වීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ගැටලුවක් ඇති වන බැවින් රක්ෂණය කිරීමකින් තොරව දැනට නිමවා ඇති ඇටවුම් පිහිටුවීමට තීරණය විය. අදාල ගිවිසුම කෙටුම්පත් කර අදාල සමිතිය සමග සාකච්ඡා කර අත්සන් කිරීම සඳහා මූලික කටයුතු සලසා ඇති අතර ඇටවුම ස්ථාපිත කර මාස තුනක් ගත වූ පසුව මෙම ගිවිසුමට එළඹීමට කටයුතු කෙරේ.	අදාළ ධීවර සංවිධාන සමග ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතු අතර ඇටවුමට සිදුවන හානි අවම කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

(i)	2021 අගෝස්තු 11 දින සිට සේවය අතහැර ගොස් තිබූ කාර්යාල කාර්යය සේවකයකුගෙන් අයවිය යුතු රු.231,597 ක ශේෂයක් පැවතුණු අතර එය වර්ෂ 3 ට වැඩි කාලයක සිට අයවීමට පැවතිය ද අදාළ නිලධාරියාගෙන් එම ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	මෙම සේවය අතහැරගොස් ඇති නිලධාරියාගේ ණය ශේෂය අය කර ගැනීම පිළිබද නීතිපතිතුමා වෙත දන්වා යවා ඇත.	ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කලයුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 කට අදාළව පුරප්පාඩු 20 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 09 ක්ද, ද්වීතියික මට්ටමේ තනතුරු 12 කට අදාළව පුරප්පාඩු 271 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 04 ක්ද පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම ද ඇතුලුව තනතුරු 25 කට අදාළව පුරප්පාඩු 304 ක් පැවතීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට රාජකාරි ඉටුකිරීම සඳහා නිලධාරීන් පත්කිරීමටත් නව බඳවා ගැනීම් සඳහා විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කිරීම සඳහා කටයුතු කරමින් පවතී. ද්වීතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විභාග පැවැත්වීමට, සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා ඉල්ලීම් කිරීමට, බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට කටයුතු කරමින් පවතී. තව ද තෘතියික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. එමෙන්ම ප්‍රාථමික අංශයේ පුරප්පාඩු වී ඇති රියදුරු සහ කාර්යාල සේවක සේවය සම්පූර්ණ කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබයි.	දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත යුතුය.